**21-03-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ශ්‍රීමත් අනුගමනය කර හිතකාමී වන්න. සෑම කෙනෙකුටම සතුට වෙතට පාර පෙන්වන්න.

**ප්‍රශ්නය:** දරුවන් විවිධ අන්දමේ වැරදීම් සිදු කිරීමේ හේතුව කුමක්ද?

**පිළිතුර:** ශරීර අවධානය. දරුවන් බොහෝ වැරදි සිදු කරන්නේ ශරීර අවධානය නිසාය ඔවුන්ට සේවය කිරීමට පවා නොහැක. සෑම කෙනෙක්ම ඔවුන්ට අකමැති වන ආකාරයේ ක්‍රියා ඔවුන් සිදුකරයි. බාබා පවසන්නේ දරුවනි, ජීව අවධානයට පත් වන්න! කිසිම වැරදි ක්‍රියාවක් සිදු නොකරන්න. කිරි හා පැණි මෙන් වී, සේවය සඳහා ඉතා හොඳ සැලසුම් සාදන්න. මුරලියට සවන් දී එය ධාරණය කරගන්න. මේ ගැන නොසැලකිලිමත් නොවන්න.

**ගීතය:** අහසේ ඔබගේ සිහසුන අතහැර මේ මහ පොළවට වඩින්න!

ඕම් ශාන්ති. ශ්‍රීමත් එන්නේ, ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ටය. බාබා දැන් සියලුම මධ්‍යස්ථාන වල සිටින අප දරුවන්ටයි කතා කරන්නේ. ප්‍රධානතම පිංතූර හය වන්නේ, ත්‍රිමූර්තිය, චක්‍රය, ගස, ඉනිමග, ලක්ෂ්මි සහ නාරායන සහ ක්‍රිෂ්ණාය. මෙය සම්පූර්ණ ප්‍රදර්ශනයකි මුළු සාරයම මේවා තුළ අන්තර්ගතය. ඔවුන් චිත්‍රපටයක් හෝ නාට්‍යයක් ආදිය ප්‍රචාරය කිරීමට සාදන දැන්වීම් පුවරු, කිසි විටෙක වැස්සෙන් නරක් වන්නේ නැත. මෙම ප්‍රධාන පිංතූර එවන් ද්‍රව්‍ය මත පිංතාරු කළ යුතුයි. ඔය දරුවන්ට ශ්‍රීමත් ලැබෙන්නේ සේවය වැඩි කර, භාරතයේ ජනයාට යහපත සැලසීමටයි. අසීමිත පියා හිතකාමී බව සිහි කර ඇති බැවින්, පියාට පැමිණ සෑම කෙනෙකුටම යහපතක් සැලසීමට සිදුවන්නේ, පාඩුවක් සිදු කරන කෙනෙක් අනිවාර්යෙන්ම සිටින බැවිනි. යහපතක් සිදුවන ආධ්‍යාත්මික දරුවන්ට මෙම දේවල් වටහා ගත හැක. අපට යහපතක් සිදු වී ඇති ආකාරයෙන් අපි අන් අයටත් යහපතක් සිදු කළ යුතුයි. සෑම කෙනෙකුටම යහපත සිදු කරන්නේ කෙසේද, යන සිතිවිලි පියාටද තිබේ. ඔහු මේ සඳහා ඔබට විවිධ ක්‍රම පෙන්වා දෙයි. පිංතූර සෑදිය යුත්තේ 6’ X 9’ තහඩු මතයි. සාමාන්‍යයෙන් රජයේ රැස්වීම් පැවැත්වෙන දිල්ලිය වැනි නගර වලට බොහෝ මිනිසුන් යයි. මිනිසුන් බොහෝ දෙනෙක් මහලේකම් කාර්යාලයට යයි. මෙම පිංතූර එහි තැබිය යුතුයි. පියා ඔබට උපදෙස් දෙන්නේ බොහෝ දෙනෙකුට යහපත සැලසීමටයි. ටින් තහඩු මත බොහෝ පිංතූර නිර්මාණය කළ හැක. ජීව අවධානයට පත් වී, පියාගේ සේවයේ තමන්ව කාර්ය බහුල කරගන්න. පියා ඔබට අවවාද කරන්නේ මෙම පිංතූර හින්දි සහ ඉංග්‍රීසි බසින් සෑදිය යුතුයි. මෙම ප්‍රධාන පිංතූර සය බොහෝ ස්ථාන වල තැබිය යුතුයි. එවන් ප්‍රධාන ස්ථාන වල ඒවා තබන්නේ නම්, ඒවා වටහාගැනීමට මිනිසුන් සිය ගණනින් ඔබ වෙතට පැමිණෙයි. කෙසේවෙතත්, දරුවන් සිටින්නේ ශරීර අවධානයෙන් නිසා, ඔවුන් අතින් බොහෝ වැරදීම් සිදුවෙයි. තමන් සම්පූර්ණයෙන්ම ජීව අවධානයෙන් සිටිනවා කියා, ඔබගෙන් කිසිවෙකු නොසිතිය යුතුයි. ඇතමුන් බොහෝ වැරදීම් සිදු කරන අතර ඔවුන් සත්‍යය නොපවසයි. අන් අයට ඔබ කෙරෙහි නොකැමැත්තක් ඇතිවන සහ ඔබ ශරීර අවධානයෙන් සිටින බව ඔවුන් ඔබට කියන අන්දමේ කිසිම වැරදි ක්‍රියාවක් ඔබ සිදු නොකළ යුතු බව, පියා විස්තර කර තිබේ. ඔබ නිරතුරුවම සිටින්නේ සටන් බිමකයි. වෙනත් තැන් වල යුද්ධයක් වසර 10 ක් හෝ 20 ක් පවතී. මායා සමඟ තිබෙන ඔබගේ යුද්ධය, අවසානය තෙක්ම තිබෙයි. කෙසේවෙතත්, එය නොපෙනෙන අතර කිසිවෙකු ඒ ගැන නොදනී. ගීතාවේ පෙන්වා ඇති මහාභාරත යුද්ධය, භෞතික එකක් වන අතර මෙම යුද්ධය, ආධ්‍යාත්මිකයි. මෙය පාණ්ඩවයන්ගේ ආධ්‍යාත්මික යුද්ධයයි. එම භෞතික යුද්ධය, උත්තරීතර පියා, උත්තරීතර ජීවය කෙරෙහි, ඔවුන්ගේ බුද්ධිය තුළ සෙනෙහසක් නොමැති අයගේය. බ්‍රහ්මණ වංශයේ සැරසිල්ල වන ඔබලාට සෙනෙහසින් යුතු බුද්ධි තිබේ. ඔබ අන් සෑම කෙනෙකුගෙන්ම තමන්ව ඉවත් කරගෙන ඒකායන පියාට සම්බන්ධ වී ඇත. ඔබ බොහෝ වාර ගණනාවක් ශරීර අවධානයට පත්වීම නිසා, ඔබට අමතක වී, එවිට ඔබගේ තත්ත්වය ඔබම විනාශ කරගනී. එවිට අවසානයේදී බොහෝ පසුතැවීමක් ඇතිවෙයි. ඒ වෙලාවෙදී කිසි දෙයක් කළ නොහැක. මෙය සෑම චක්‍රයකටම ගනුදෙනුවකි. මෙකල වැරදි ක්‍රියා සිදුවන්නේ නම්, සෑම චක්‍රයකදීම තත්ත්වය විනාශ වෙයි. විශාල පාඩුවක් සිදුවෙයි. පියා විස්තර කරන්නේ පෙරකල ඔබ 100% ක පාඩුවකයි සිටියේ. පියා දැන් ඔබව 100% ලාභයකට රැගෙන යනවා. එබැවින් ඔබ ශ්‍රීමත් අනුගමනය කළ යුතුයි. ඔය සෑම දරුවෙක්ම හිතකාමී විය යුතුයි. සෑම කෙනෙකුටම සතුටට මාර්ගය පෙන්වන්න. දිව්‍ය ලෝකයේ සතුට තිබෙන අතර අපායේ දුක තිබේ.

ඇයි? මෙය දූෂිත ලෝකයයි. එම ලෝකය, දූෂණයෙන් තොර වූ නමුදු එය දැන් දූෂිත වී ඇත. පියා දැන් නැවත වරක් එය දූෂණයෙන් තොර බවට පත් කරවයි. මෙම දේවල් පිළිබඳව ලෝකයේ කිසිම කෙනෙක් නොදනී. මෙම ප්‍රධාන පිංතූර ස්ථිර ස්ථාන වල තැබිය යුතුයි. අංක එකේ ප්‍රධාන ස්ථානය දිල්ලිය වන අතර ඉන්පසුව බොම්බායද පසුව කල්කටාවයි. ඒවා ටින් තහඩු මත පිංතාරු කරන ලෙස, ඔබට යමෙකුට ඇණවුම් කළ හැක. බොහෝ සංචාරකයන් අග්‍රා වලට යයි. ඔය දරුවන් ඉතා හොඳින් සේවය කරන නමුත් ඔබ දැන් යම් විශිෂ්ඨ දෙයක් කර, එය බාබාට පෙන්විය යුතුයි. මෙම පිංතූර නිර්මාණය කරගැනීමට අපහසුතාවයක් නැත. අවශ්‍ය වන්නේ අත්දැකීම් පමණයි. මිනිසුන්ට ඒවා දුර සිට කියවිය හැකි අන්දමින්, ඉතා හොඳ විශාල පිංතූර තිබිය යුතුයි. චක්‍රයේ වුවද ඉතා විශාල පිංතූරයක් සෑදිය හැක. කිසි කෙනෙකුට ඒවාට හානියක් සිදු කිරීමට නොහැකි අන්දමින් ඒවා ආරකෂිතව තැබිය යුතුයි. මෙය අළුත් දෙයක් බැවින් රකුසන් මෙම යාගහෝමයට බාධක ඇති කරයි. ඔවුන් පවසන්නේ ඔබ, ඔබගේ ව්‍යාපාරය ආරම්භ කරලා. අවසානයේදී ඔවුන් සෑම කෙනෙක්ම පහළට පැමිණි ඇති බවත් නිසැකයෙන්ම යම් අඩුවක් ඇති බවත් සෑම කෙනෙකුටම වැටහෙයි. පියා හිතකාමී කෙනාය. භාරතය හිතකාමී වූයේ කවදාද සහ කෙසේද කියා පැවසිය හැක්කේ ඔහුට පමණයි. භාරතය තමෝප්‍රධාන් කරවන්නේ කවුරුන්ද සහ ඉන්පසුව එය සතෝප්‍රධාන් කරවන්නේ කවරෙක්ද එමෙන්ම චක්‍රය බ්‍රමණය වන්නේ කෙසේද කියා, කිසිවෙක් නොදනී. කිසිම කෙනෙක් සංගම යුගය ගැනවත් නොදනී. දෙවියන් සෑම යුගයකම පැමිණෙන බව, ඔවුන් විශ්වාස කරයි. දෙවියන් නමක් සහ රූපයක් ඉක්මවා ඇති බව ඔවුන් විටෙක කියයි. භාරතය, පෞරාණික දිව්‍ය ලෝකය විය. ක්‍රිස්තුස් වහන්සේට වසර 3000 කට පෙර, එය දේවතාවන්ගේ රාජධානිය වූ බවත් මිනිසුන් පවසයි. කෙසේවෙතත්, ඔවුන් චක්‍රයේ කාලවකවානුව දීර්ඝ කර ඇත. එබැවින් දරුවනේ, ඔබ ජීව අවධානයට පත් වීමට බොහෝ උත්සාහ දැරිය යුතුයි. චක්‍රයෙන් භාගයක්, ස්වර්ණමය සහ රිදී යුගයන්හිදී, ඔබ ජීව අවධානයෙන් සිටි නමුත් ඔබට දෙවියන්ගේ අවධානයක් තිබුණේ නැත. මෙහි ඔබ ශරීර අවධානයට පත් වී ඇත. ඔබ දැන් නැවතත් ජීව අවධානයට පත් විය යුතුයි. ඔවුන් 'වන්දනා ගමන' යන වචනය භාවිත කරන නමුත් ඔවුන් එහි අරුත නොදනී. 'මන්මනභව'හි අරුත වන්නේ ආධ්‍යාත්මික වන්දනා ගමනේ සිටින්න. ඕ, ජීවයනි, ඔබගේ පියා වන මා සිහි කරන්න! ක්‍රිෂ්ණාට මෙය කිව නොහැක. ඔහු ගීතාවේ දෙවියන් වන්නේ කෙසේද? කිසි කෙනෙකුට ඔහුට අපහාස කළ නොහැක. ඔබ ඉනිමග දිගේ පහළට පැමිණි විට, ඔබ චක්‍ර භාගයක් රාග කොතේ අසුන්ගෙන අවලස්සන වූ බවත් පියා විස්තර කර දී ඇත. එය දැන් කලි යුගයයි. මෙහි මුළු සමාජයම අවලස්සනයි, නමුත් සෑම කෙනෙකුගේම අවලස්සන ස්වරූපය පෙන්වන්නේ කෙසේද? ඔවුන් සියලුම පිංතූර නිර්මාණය කර තිබෙන්නේ කිසි වැටහීමකින් තොරවයි. ඔවුන් පෙන්වා දී ඇති අන්දමට, එක් කෙනෙක් පමණක් අවලස්සන සහ ලස්සන වන්නේ කෙසේද? ඔවුන් හැඳින්වෙන්නේ, අන්ධ විශ්වාසය තුළින් බෝනික්කන්ට වඳින අය ලෙසින්ය. බෝනික්කන්ට නමක්, ස්වරූපයක් හෝ කාර්යයක් තිබිය නොහැක. පෙරකල ඔබත් බෝනික්කන්ට වන්දනාමාන කළ අතර ඔබද කිසි දෙයක අරුත වටහාගත්තේ නැත. එබැවින් ප්‍රදර්ශන වල ප්‍රධාන පිංතූර නිර්මාණය කළ යුතු අන්දම ගැන බාබා විස්තර කර ඇත. එක් ප්‍රදර්ශනයකින් පසුව තවත් ප්‍රදර්ශනයක් පවත්වා ගෙන යාම සඳහා කොමිටියක් තිබිය යුතුයි. බන්දන වලින් නිදහස් වූ බොහෝ දෙනෙක් සිටියි. කුමාරීන් බන්දන වලින් නිදහස්ය. විශ්‍රාමික තත්ත්වයේ සිටින අයත් බන්දන වලින් නිදහස්ය. එබැවින් දරුවනේ, ඔබ මෙම උපදෙස් ප්‍රායෝගික කළ යුතුයි. ඔබ අදෘෂ්‍යමාන පාණ්ඩවයන්ය. කිසි කෙනෙකුට ඔබව හඳුනාගත නොහැක. පරම පියා අදෘෂ්‍යමාන වන අතර දැනුමද අදෘෂ්‍යමානයි. එහි මනුෂ්‍යයන් මනුෂ්‍යයන්ට දැනුම දෙයි. මෙහි, පරමාත්ම පියා, උත්තරීතර ජීවාත්මය, ජීවාත්මයන්ට දැනුම දෙයි. කෙසේවෙතත්, ජීවාත්ම, දැනුම ලබා ගන්නා බව ඔවුන්ට වැටහෙන්නේ නැත, මන්ද ජීවාත්ම, ක්‍රියාවන්ගේ ඵලයේ බලපෑමට ලක් නොවන බව ඔවුන් සලකයි. ඇත්ත වශයෙන්ම සෑම දෙයක්ම කරන්නේ ජීවයයි. ඔවුන්ගේ ක්‍රියා වලට අනුව, නැවත උපත් ගන්නේ ජීවාත්මයි. පියා ඉතා හොඳින් මේ සියලුම කරුණු ඔබගේ බුද්ධිය තුළ සනිටුහන් කරවයි. සෑම මධ්‍යස්ථානයකම, අංක පිළිවෙලට ජීව අවධානයෙන් සිටින දරුවන් තමයි ඉතා හොඳින් වටහාගෙන ඉන්පසුව අන් අයටද විස්තර කර දෙන්නේ. ශරීර අවධානයෙන් සිටින අයට කිසි දෙයක් වටහාගැනීමට නොහැකි වන අතර වෙන අයට විස්තර කිරීමටද නොහැක. ඔබට කිසි දෙයක් වැටහෙන්නේ නැති බව කීමත් ශරීර අවධානයයි. ඔබ ජීවයකි. ඔබගේ මොළය විවෘත විය යුතුයි. එය ඔබගේ භාග්‍යයේ නැත්නම් එය විවෘත වන්නේ නැත. පියා ඔබව උත්සාහ දැරීමට දිරිගන්වන නමුත් එය ඔබගේ භාග්‍යයේ නොමැති නම්, ඔබ උත්සාහ දරන්නේ නැත. ඇල්ෆා සහ බීටා වටහාගැනීම ඉතා පහසුයි. ඔබට උරුමයක් ලැබෙන්නේ අසීමිත පියාගෙනි. භාරතයේ ඔය සියලුම මිනිසුන් දේවතාවන් සහ දෙවඟනන් වී සිටියා. පුරවැසියන්ද එසේ විය. මෙකල ඔවුන් අපවිත්‍ර වී සිටියි. තමන් ජීවාත්මයක් බව සලකා, පරමාත්ම පියා සිහිපත් කිරීමට කියා ඔබට බොහෝ වාර ගණනාවක් පවසා තිබේ.

පියා පවසන්නේ දරුවනි, මා ඔබව දෙවිවරුන් සහ දේවතාවියන් බවට පත්කළා. ඔබ දැන් කුමක් බවට පත්ව සිටියිද? මෙය අපායේ අන්ත අගාධයයි. මනුෂ්‍යයන්, සත්වයන් සහ කුරුල්ලන් යන සියල්ලම එකම පාපයන්ගේ විෂ ගංගාවේ සිටින ආකාරය ඔවුන් පෙන්වයි. මෙහි මනුෂ්‍යයන් සතුන්ටද වඩා පහත් වී ඇත. මනුෂ්‍යයන්ට බොහෝ සේ කෝපය තිබේ. ඔවුන් මිනිසුන් සිය දහස් ගණන් මරා දමයි. ගණිකා මඩමක් බවට පත් වී ඇති භාරතය, ශිවාගේ දේවාලය බවට පත් කරවන්නේ ශිව බාබා පමණයි. පියා ඉතා හොඳින් විස්තර කරයි. ඔහු ඔබට මේ මේ දේ කරන්නට කියා උපදෙස් දෙයි. පිංතූර සාදා, ඉන්පසුව වැදගත් මිනිසුන්ට විස්තර කරන්න. මෙය එම පෞරාණික යෝගාවයි. සෑම කෙනෙක්ම මෙම පෞරාණික දැනුමට සවන් දිය යුතුයි. ශාලාවක් කුලියට ගෙන, ප්‍රදර්ශනයක් පවත්වන්න. ඔවුන් ඔබගෙන් කිසි මුදලක් ආදිය නොගත යුතුයි. කෙසේවෙතත්, ඔවුන්ට මෙසේ කියන්න ඔබට හොඳයි කියා සිතන ඕනෑම මුදල් ප්‍රමාණයක් අපෙන් අය කර ගන්න. පළමුව, මෙම පිංතූර දෙස පමණක් බලන්න! ඔවුන් පිංතූර දකින විට ඉතා විගසින් ඔබගේ මුදල් ඔබට ආපසු ලබා දෙනු ඇත. ඔබ කළ යුත්තේ උපක්‍රමශීලීව විස්තර කිරීම පමණයි. බලතල ඔබගේ අතේ තිබේ. ඔබට අවශ්‍ය නම් සෑම දෙයක්ම කළ හැක. ඔවුන්ට කිසි දෙයක් වැටහෙන්නේ නැත. විනාශ කාලයේදී ඔවුන්ගේ බුද්ධිය තුළ සෙනෙහස නොතිබූ අය, විනාශය කරා ගිය අතර පාණ්ඩවයන් ඔවුන්ගේ අනාගත තත්ත්වය හිමි කර ගත්හ. එම රාජධානිය අනාගතයේ පැවතෙයි. එය දැන් නොපවතී. ඒ සියලුම ගොඩනැගිලි විනාශ වෙයි. ඔබ ප්‍රදර්ශන පැවැත්විය යුතු බව, පියා විස්තර කර තිබේ. මිනිසුන්ට ඉතා අලංකාර ආරාධනා පත් යවන්න. පළමුවෙන්ම වැදගතුන්ට විස්තර කරන්න, එවිට ඔබට උපකාර වුවද ලැබෙයි. නින්දේ පසුවන්න එපා! සමහර දරුවන් ශරීර අවධානයේ නින්දේ සිටියි. කොමිටියක් පත් කරගන්න. කිරි පැණි මෙන් වී සැලසුම් සාදන්න. ඔබ මුරලිය හදාරන්නේ නැත්නම් ඔබ කිසිවක් ධාරණය කරගන්නේ කෙසේද? බොහෝ සේ නොසැලකිලිමත් අය බොහෝ දෙනෙක් සිටියි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණු දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ජීව අවධානයට පත් වී, සේවය කිරීමට විවිධාකාර ක්‍රමවේද සාදා ගන්න. එකිනෙකා සමඟ කිරි හා පැණි මෙන් වී, සේවය කරන්න. හිතකාමී පියා හා සමානව ඔබත් හිතකාමී වන්න.
2. සෙනෙහසින් යුතු බුද්ධියක් ඇති කරගන්න, අන් සියලුම දෙනාගෙන් ඉවත් වී, ඒකායන කෙනාට තමාව සම්බන්ධ කරගන්න. සෑම කල්පයකටම පාඩුවක් සිදුවන අන්දමේ, කිසිදු වැරදි ක්‍රියාවක් නොකරන්න.

**වරදානය:** ඔබ නොසෙල්වෙන සහ නොසැලෙන, නොබැඳී ජයග්‍රාහකයෙකු සහ ස්මරණයෙ ප්‍රතිමූර්තියක් වීමට අසීමිත නිරාශාව පිළිබඳ ආකල්පයක් ඇති කරගනිත්වා.

නිරන්තරයෙන් අසීමිත නිරාශාව පිළිබඳ ආකල්පයක් ඇති අය, ඕනෑම දර්ශනයක් දුටු විට කිසි විටෙකත් බිය වන්නේ හෝ සැලෙන්නේ නැත. ඔවුන් නිරන්තරයෙන් නොසැලෙන සහ නිශ්චලව සිටිති. ඔවුන්ගේ අසීමිත නිරාශාව පිළිබඳ ආකල්පය නිසා, ඔවුන් නොබැදි සහ ස්මරණයෙ ප්‍රතිමූර්ති ජයග්‍රාහකයින් බවට පත්වේ. ඔබ යමක් දකින විට, සුළු වශයෙන් හෝ සෙලවුනහොත්, නැතහොත් ඔබට බැඳීමක්ය තිබේ නම්, ඔබ අංගද් මෙන් නොසැලෙන සහ නිශ්චල යැයි නොකියනු ඇත. ඔබේ අසීමිත නිරාශාව පිළිබඳ ආකල්පය සමඟ, පරිණතභාවය ඇතිව, විනෝදාත්මක ස්වභාවයක් ද ඇත.

**පාඨය:** ස්වයං-ස්වෛරී වීම මෙන්ම, අසීමිත නිරාශාව පිළිබඳ ආකල්පයක් තිබීම රාජ් ඍෂිවරයෙකුගේ ලකුණකි.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයෙ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් නිර්භීත හා බාධක වලින් නිදහස්ව සිටින්න.**

නිෂ්පල සිතුවිලි හෝ සැක ඇති තැන, පරමාත්ම පියා නිරන්තරයෙන් ඔබේ ආරක්ෂකයා සහ ඔබේ ප්‍රතිලාභියා යන බලවත් සිතුවිල්ල ඔබ තුළ තිබිය යුතුය. මෙම විශ්වාසය තිබීමෙන් නියත වශයෙන්ම ජයග්‍රහණයක් ඇත. එබැවින්, ප්‍රශ්නාර්ථ ලකුණෙහි වංක මාර්ගය නොගෙන, ප්‍රතිලාභ තිත නිරන්තරයෙන් යොදන්න: සම්පූර්ණ නැවතුම! මෙම ක්‍රමය භාවිත කිරීමෙන්, ඔබට සියල්ල පහසු වන අතර ඔබ සාර්ථකත්වය අත්කර ගනු ඇත.